**UNIVERSITY OF PERADENIYA**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 200 මට්ටම - 2024**

**கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதிய பாடத்திட்டம்) 200 வது தேர்ச்சி மட்டம் – 2024**

**Bachelor of Arts (External - New Syllabus) Examination 200 Level - 2024**

**සාහිත්‍ය න්‍යාය සහ සාහිත්‍ය විචාරය**

**SINE 201**

කාලය පැය **(03)** කි
மூன்று(03) மணித்தியாலங்கள்.
Time three **(03)** Hours.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Marks will be deducted for illegible hand writing.

එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න <u>පහකට 05ට</u> පිළිතුරු සපයන්න.
------ வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer ------ questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08කි.
இந்த வினாப்பத்திரத்தில் ------ வினாக்கள் உள்ளன.
There are ------- questions in the question paper.

---

## I කොටස

(01). ''බ්‍රහ්මාස්වාදයේ සහෝදරයා වූ රසය සහෘදයෝ කාව්‍ය පරිශීලනයෙන් ලබති.'' ඉහත ප්‍රකාශය රසවාදය ඇසුරින් විමසන්න.

(02). ''උචිත බව රැකිය යුතු වන්නේ කාව්‍යයෙහි කවර අංග මගින් දැයි ඖචිත්‍ය විචාරවාදය ඇසුරින් විචාරාත්මකව සාකච්ඡා කරන්න.

(03). ''කාව්‍ය ශරීරයට කාව්‍යභාවය ආරෝපණය කරන්නේත්, කිසියම් රචනයක් කාව්‍ය තත්ත්වයට පමුණුවන්නේත් අලංකාරයි.'' ඉහත කී කියමන රසවාදයත් ආශ්‍රය කොට, විග්‍රහ කරන්න.

(04). භාරතීය විචාරවාදවල කාව්‍ය ගුණ හා කාව්‍ය දෝෂ සාකච්ඡා කොට ඇත්නම් ඒ කවරේදැ'යි විමර්ශනය කරන්න.

## II කොටස

(05). ස්ත්‍රිය පරපීඩනයට, සූරාකෑමට, අසමානත්වය සහ අප්‍රධාන බවට පත් වන්නේ දැයි ස්ත්‍රීවාදී සාහිත්‍ය ශානර ආශ්‍රයෙන් විමසන්න.

(06). ''සොබාදහම කෙරෙහි කිසියම් උත්තේජනයක් ඇතිකිරීම පරිසරවාදී සාහිත්‍ය විචාරයෙහි ප්‍රධාන අරමුණයි.'' පක්ෂ ව හෝ විපක්ෂ ව කරුණු දක්වන්න.

(07). 'නූතනවාදය නව ප්‍රකාශන විධි සොයා යමින් කලාත්මක හා දාර්ශනික දැක්මක් හා සමාධිගත වන්නේදැ'යි විමසන්න.

(08). කිසියම් පඨිතයක් විසංයෝජනාත්මක ව කියවන්නේ කවරාකාරයෙන්දැ'යි සනිදර්ශනව විමසන්න.

(සැම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගිනි).